කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2011
2012 දෙසැම්බර් / 2013 ජනවාරි

මානවශාස්ත්‍ර පීඨය

ප්‍රතිබිම්බ කලා - IMAT- E2025

ලෝක සිනමාව පිළිබඳ ගවේෂණයක්

<u>ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.</u>

ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි　　　　　　　　　　　　කාලය : පැය 03 යි

---

01. වාර්තා හා වෘත්තාන්ත සිනමාවේ අනන්‍යතා පිළිබඳ තුලනාත්මක ඇගයීමක් කරන්න.

02. කලාත්මක හා ජනප්‍රිය සිනමාවේ මතවාද පිරික්සන්න.

03. සෝවියට් සිනමාවෙන් ලෝක සිනමාවට දායාද කළ සිනමා භාවිතයන් පෙන්වා දෙන්න.

04. චාලි චැප්ලින්ගේ සිනමාව සංඥා බසක් සහිත සිනමාවක් දැයි ඔහුගේ ප්‍රකට සිනමා කෘති පාදක කරගනිමින් උක්ත අදහස විමසුමට ලක්කරන්න.

05. බොලිවුඩ් සිනමාව යනු කුමක්දැයි හඳුන්වා දෙමින් එම සිනමා සම්ප්‍රදාය නියෝජනය කරන සිනමා කෘති මගින් ප්‍රකට කෙරෙන සමාජ හා සංස්කෘතික ප්‍රකාශනය පිළිබඳ විමසීමක් කරන්න.

06. ජර්මන් ප්‍රකාශනවාදී සිනමාවේ භාවිතය හා දෘෂ්ටිය පිළිබඳ විග්‍රහයක් කරන්න.

07. ඉතාලියානු නව තාත්විකවාදී සිනමාවේ ප්‍රමුඛ පෙළේ සිනමාකරුවෙකු තෝරාගෙන ඔහුගේ සිනමා භාවිතය ඇගැයීමට ලක් කරන්න.

08. සම්ප්‍රදායික සිනමාව මෙන්ම සිනමාවේ ආඛ්‍යාන රටාව ද (Narative style) ප්‍රංශ නවරැල්ල මගින් වෙනස්වූයේ දැයි ඔවුන්ගේ විශිෂ්ට සිනමා කෘති ඇසුරින් විමසීමක යෙදෙන්න.

09. කෙටි සටහන් ලියන්න.

    i. අද්භූත / Horror චිත්‍රපට
    ii. ප්‍රකාශනවාදී / Expressionlism චිත්‍රපට ශෛලිය
    iii. බැසිල් රයිට් / Basil Wright
    iv. සිනමාවේ මිස් - ඔන් - සෙන් /Mise-En-sc'ene සංකල්පය

**************************